Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# අපනයන සැකසුම් කලාප තුළ සේවකයින්ගේ රැකියා තෘප්තියට වැටුපේ බලපෑම (සීතාවක අපනයන සැකසුම් කලාපය ඇසුරින්)

***ආර්.අයි.මදූෂානි*** [1]
***කේ.එම්.පී.පොඩිමැණිකේ*** [2]

සංක්ෂේපය

මෙම පර්යේෂණය අපනයන සැකසුම් කලාප තුළ සේවකයන්ගේ රැකියා තෘප්තියට වැටුපේ බලපෑම යන ප්‍රස්තුතය යටතේ කරන්නට යෙදුණි. එනම් යම් පුද්ගලයෙකු රැකියාවේ යෙදීම නොයෙදීම තීරණය වීමේදී සලකා බලන ප්‍රධාන සාධකයක් ලෙස වැටුප හඳුනා ගත හැකිය. ඒ අනුව අපනයන සැකසුම් කලාප තුළ සේවකයන්ගේ රැකියා තෘප්තියට බලපාන එකම ප්‍රධාන සාධකය වැටුප් පමණක් ද සහ එම සේවකයින් වැටුප් මගින් පමණක් තෘප්තිමත් කළහැකි ද යන අධ්‍යයන ගැටළුව විසඳා ගැනීමට මෙම පර්යේෂණයෙන් බලාපොරොත්තු වේ.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ලෙස අපනයන සැකසුම් කලාප තුළ සෙවකයින්ගේ වැටුප සහ රැකියා තෘප්තිය අතර ඇති සම්බන්ධතාවය සොයා බැලීම දැක්විය හැකිය. සෙසු අරමුණු වන්නේ, සේවකයින්ගේ රැකියා තෘප්තිය සඳහා බලපාන වෙනත් සාදක සොයා බැලීම. ඒ සඳහා සංගහණය ලෙස ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාප අතරින් කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක අපනයන සැකසුම් කලාපය තෝරා ගත් අතර, නියදිය ලෙස නිස්සසම්භාවී නියදුම් ක්‍රමය යටතේ පහසු නියදිම භාවිත කරමින් සීතාවක අපනයන සැකසුම් කලාපය තුළ ඇති කර්මාන්තශාලා 28 න් කර්මාන්තශාලා 4 ක සහ 22000 ක් පමණ වූ මුළු සේවක ප්‍රමාණයෙන් සේවකයින් 80 ක් තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණ යොදා ගන්නා ලදී.

ක්ෂේත්‍රයේදී ලබා ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණයෙන් ලැබුණු ප්‍රධාන නිගමනය වූයේ අපනයන සැකසුම් කලාප තුළ සේවකයන්ගේ රැකියා තෘප්තිය සහ වැටුප අතර ප්‍රභල ධන සම්බන්ධතාවක් පවතින බවයි. ඔවුන් අතරින් බහුතරය වැටුප් සම්බන්ධයෙන් තෘප්තිමත් නොවූ නමුත් ඔවුන්ගේ කෙටි කාලීන අරමුණු සඳහා ඔවුන් රැකියාවේ නිරත වන බව පැහැදිලිය. වැටුප් කෙරෙහි ආකර්ෂණය නොවූවත් අතිකාල දීමනා සම්බන්ධව සේවකයින් තෘප්තිමත් වන අතර එය රැකියාව කිරීමට පොළඹවයි. වැටුපට අමතරව රැකියාවේ සුරක්ෂිතභාවය, වැඩ පරිසරය, ආයතන කළමනාකරීත්වය, ආයතන පහසුකම් යනාදී සාධක ඔවුන්ගේ රැකියා තෘප්තියට බලපානු ලබයි.

අපනයන සැකසුම් කලාප තුළ සේවකයින්ගේ රැකියා තෘප්තියට වැටුප තීරණාත්මක සාධකයක් වන බැවින් සේවකයන් දීර්ඝ කාලීනව රඳවා තබා ගැනීමට ආයතනයේ ලාභ සඳහා ඔවුන්ට ද හිමිකමක් ඇතිවන ලෙස ලාභ වෙන් කිරීම, මූලික වැටුප් මට්ටම් ඉහළ නැංවීමට නීති සංශෝධනය කිරීම, සෙවකයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය මට්ටම සහ යහපත් සමාජ ප්‍රතිරූපයක් ගොඩ නැංවීම පිළිබඳ අවධානය යොමු කොට වැඩ පිළිවෙලවල් සකස් කිරීම යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.

මෙම යෝජනා ක්‍රියාවට නැංවීම තුළින් අපනයන සැකසුම් කලාප තුළ සේවකයින් ඉතා ඵලදායීව, කාර්යක්ෂමව හා වගකීමෙන් තම රැකියාව තෘප්තියෙන් යුතුව සිදු කරන බව මෙම පර්යේෂණය මගින් අවධාරණය කෙරේ.

මුඛ්‍ය පද - රැකියා තෘප්තිය, වැටුප, ආයෝජන මණ්ඩලය, සීතාවක අපනයන සැකසුම් කලාපය

1.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය: isankas11@gmail.com
2.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය